**ජාතික වැව්ලි කළමනාකරණ ආයතනය - 2023**

**-----------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ජාතික වැව්ලි කළමනාකරණ ආයතනයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 1979 අංක 45 දරන ජාතික වැව්ලි කළමනාකරණ ආයතන පනතේ, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනයේ අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ආයතනය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 ජූලි මස 18 දිනැති අංක 2341/19 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය ප්‍රකාරව ජාතික වැවිලි කළමනාකරණ ආයතනයේ සාමාජිකත්වයලත් සාමාජිකයන් 105 කින් 2023 වර්ෂයේ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය තුළ ලැබූ ආදායම රු.217,900 ක් ලෙස හඳුනාගෙන තිබූ නමුත් එම ආදායම් හඳුනා ගැනීමට අදාළ නිශ්චිත ගිණුම්කරණ ප්‍රතිපත්තියක් මූල්‍ය ප්‍රකාශන තුළ හෙළිදරව් කර නොතිබුණි. | ආයතනය උපචිත පදනම සැලකිල්ලට ගෙන මූල්‍ය ප්‍රකාශනය ඉදිරිපත් කරන අතර ඒ බව ගිණුම් කරන ලද ප්‍රතිපත්තියේ 2.1 යටතේ පැහැදිලිවම සඳහන් කර ඇත. කෙසේ නමුත් මෙය සාමාජිකයන්ගේ ගාස්තුද එම පදනම මතම ක්‍රියා කරන බව සඳහන් කරමින් පෙන්වා දී තිබූ හෙළිදරව් කිරීමේ දෝෂය නිවැරදි කරනු ඇත. | සියළුම ආදායම් හඳුනා ගැනීමට නිශ්චිත හා සාමාන්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්තියක් යොදාගෙන මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2013 වර්ෂයේදී ප්‍රත්‍යාගණනය කර තිබුණු ලී බඩු උපකරණ අයිතම 16 ක් සමාලෝචිත වර්ෂයේදී භාවිතයෙන් ඉවත් කර තිබුණු නමුත් එම ලී බඩු උපකරණවලට අදාළ රු.191,616 ක ප්‍රත්‍යාගණන ලාභය ප්‍රත්‍යාගණන සංචිත ගිණුමින් ඉවත් කර සමුච්චිත අරමුදල් ගිණුමට මාරුකර නොතිබුණු බැවින් ප්‍රත්‍යාගණන සංචිතය රු.191,616 කින් අධිගණනය වී සමුච්චිත අරමුදල එම වටිනාකමින් අවප්‍රමාණය වී තිබුණි. | 2013 දී ප්‍රත්‍යාගණනය කරන ලද රු.191,616 වන ලී බඩු හා උපකරණ අපහරණය කිරීම මඟින් ප්‍රත්‍යාගණන ලාභ ගිණුමෙන් රඳවාගත් ලාභ සංචිත ගිණුමට මාරු කරමින් සිදු වී ඇති අඩු පාඩුව නිවැරදි කිරීමට කටයුතු කරනු ඇත. | ප්‍රත්‍යාගණන ලාභ/ අලාභ නිවැරදිව ගිණුම් ගත කළ යුතුය. |
| (ආ) 2023 ජූලි 27 දිනට රු.644,905 ක ධාරණ අගයන් සහිත බගවන්තලාව පුහුණු | බගවන්තලාව පුහුණු මධ්‍යස්ථානයේ ආරක්ෂාවට ඉදි කර තිබූ වැට 2023/07/27 | ප්‍රත්‍යාගණන ලාභ/ අලාභ හා ක්ෂය වීම් |

| | | |
|---|---|---|
| මධ්‍යස්ථානයේ වැට රු.282,500 කට ප්‍රත්‍යාගණය කිරීම මත හඳුනාගත යුතු රු.362,405 ක ප්‍රත්‍යාගණිත අලාභය ප්‍රත්‍යාගණන සංචිත ගිණුම තුළ රු.482,500 ක් ලෙස හඳුනා ගැනීමෙන් ප්‍රත්‍යාගණිත අලාභය රු.120,095 කින් අධි ප්‍රමාණය වී තිබුණු අතර එම වැට සඳහා 2023 ජනවාරි 01 සිට 2023 ජූලි 27 දක්වා කාලයට අදාළ රු.43,595 ක ක්ෂය අගයද ගිණුම් ගතකර නොතිබුණි. | වන දින රු.282,500 ක් ලෙස නැවත තක්සේරුවට භාජනය කර ඇත. මෙමඟින් සිදු වී තිබූ හඳුනාගත් ප්‍රත්‍යාගණන අලාභය වූ රු.362,405 ක් ලෙස අදාළ ගිණුම නිවැදි කිරීමටත් කටයුතු කරනු ඇත. | නිවැරදිව ගලපා ගිණුම් ගත කළ යුතුය. |
| (ඇ) 2023 දෙසැම්බර් 31 දිනට හඳුනා නොගත් බැර ශේෂ වල එකතුව රු.842,450 ක් ජංගම වගකීම් හෝ හඳුනා නොගත් ආදායම් ලෙස ගිණුම් තැබීමෙන් තොරව ජංගම වත්කම් වලින් අඩුකර පෙන්වා තිබුණු බැවින් ජංගම වත්කම් එම ප්‍රමාණයෙන් අවප්‍රමාණය වී තිබුණි. | හඳුනා නොගත් ගිණුම් ශේෂය රු. 842,450 ක් පවතී. මෙම සිසුන්ගේ තැන්පතු තොරතුරු වරින් වර ගිණුම් අංශයට ලබාදෙන අතර එසේ ලබා දුන් පසු එම මුදල සඳහා වෙන්කර ඇති ලදුපත් සම්පූර්ණ කර ණයගැති ශේෂයෙන් අඩුකිරීමට කටයුතු කරනු ලැබේ. මෙම සිසුන් සහතික පත්‍ර ලබා ගැනීමේදී මෙම තොරතුරු ඉදිරිපත් කළයුතු බැවින් එම අවස්ථාවේදී මෙම බොහොමයක් තැන්පතු හඳුනාගැනීමට අවස්ථාව ලැබෙනු ඇත. | මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී සියළුම ආදායම් හඳුනා ගැනීමට කටයුතු කළයුතු අතර තව දුරටත් හඳුනා නොගත් ආදායම්, නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඈ) 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව තොග අයිතම 4 ක අවසන් තොගයේ වටිනාකම රු.2,140,025ක් ද එදිනට තොග සමීක්ෂණ වාර්තා අනුව වටිනාකම රු.2,200,598 ක් ද වූ බැවින් තොග ශේෂය රු.60,573කින් අධිගණනය වී තිබුණි. | තොග සමීක්ෂණ වාර්තාවලට අනුව ඇතුළත් කළයුතු ශේෂයන් මූල්‍ය ප්‍රකාශනයන්ට ඇතුළත් කර සිදුවී ඇති අඩුපාඩුව නිවැරදි කරනු ඇත. | තොගය නිවැරදිව ගිණුම් ගත කළ යුතුය. |
| (ඉ)නේවාසිකාගාර ජලනල පද්ධතිය සහ මලාපවාහන පද්ධතිය ප්‍රතිසංස්කරණය කිරීමට අදාළව 2022 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ශේෂය රු.1,477,185 කින් රු.624,131 ක් 2023 ජනවාරි 10 දින පෞද්ගලික ආයතනයක් වෙත ගෙවා තිබුණද 2023 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ශේෂය රු.1,477,185ක් ලෙස මූල්‍ය ප්‍රකාශනයේ දැක්වීමෙන් වගකීම් රු.624,131කින් අධිගණනය වී තිබුණි. | නේවාසිකාගාරයේ ජලනල පද්ධතිය හා මලාපවාහන පද්ධතිය ප්‍රතිසංස්කරණය කිරීමට අදාළ 2022/12/31 දිනට ගෙවිය යුතු ශේෂය රු.1,477,185 තුළින් වූ රු.624,131 ක් වූ මලාපවාහන පද්ධතිය සැකසීම සඳහා ස්වාධිකාරී බලය හිමි ඉකෝ ඉංජිනියර්ස් Eco Engineer's ආයතනය වෙත 2023.01.10 දින ගෙවා ඇති බැවින් 2023/12/31 දිනට අධිගණනය වූ රු.624,131 ක් වූ ණයහිමි ශේෂය අඩුකර සිදු වී ඇති අඩුපාඩුව නිවැරදි කිරීමට කටයුතු කරනු ඇත. | ගෙවිය යුතු ශේෂ නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

## 1.6 ලැබිය යුතු ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 වර්ෂයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වත්කම් යටතේ පෙන්වා ඇති රු.31,947,618 ක වෙළඳ ලැබිය යුතු දෑ ශේෂය තුළ වර්ෂ 4 ට වඩා වැඩි රු.202,575 ක ශේෂය අයකර ගැනීමට ආයතනය විසින් මේ දක්වා කටයුතු කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශයේ ඇතුළත් රු.31,947,617 ක් වූ ණයගැති ශේෂයන්ගෙන් මේ වන විට 80 % කට වඩා මුදල් මේ වන විට අයකරගෙන ඇත. මෙම ණයගැතියන්ගෙන් ප්‍රධාන ණයගැතියා වන අධ්‍යාපන අමාත්‍යාංශය වෙතින් 13 වසරක අඛණ්ඩ අධ්‍යාපන වැඩසටහන් සඳහා ලැබිය යුතුව තිබූ මුදල රු.13,407,457 කි. එම මුදලෙන් රු.10,539,200 මුදලක් අයකරගෙන ඇති අතර එහි ඉතිරි මුදල අය කරගැනීම සඳහා කටයුතු සම්පාදනය කර ඇත. | ලැබිය යුතු ශේෂ අයකර ගැනීමට නොපමාව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 399,850 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 8,548,607 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 8,148,757 ක පිරිහීමක් නිරීක්ෂණය විය. පෙර වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ වැටුප්, වේතන හා සේවක ප්‍රතිලාභ, සැපයුම් හා පාරිභෝජන භාවිතයන්, අළුත් වැඩියා හා නඩත්තු , සන්නිවේදන හා උපයෝගිත සේවා, පුහුණු වියදම් ඇතුළත් ධාරිතා සංවර්ධනය, පහසුකම් කුලියට දීම්, බොගවන්තලාව ප්‍රාදේශීය මධ්‍යස්ථානයේ වියදම්, ක්ෂය වියදම්, වෙනත් වියදම් ආදියෙහි පිළිවෙලින් රු.5,917,344, රු.1,354,217, රු.498,552, රු.6,656,605, රු.20,459,960, රු.4,291,449, රු.510,861, රු.3,222,318, රු.938,420 කින් වැඩි වීම් මෙම පිරිහීමට බලපා තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන් වල ප්‍රවණතා විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්, ඉකුත් වර්ෂය සමඟ සසදා පහත පරිදි වේ.

| විෂය | 2023 වර්ෂය<br>රු. | 2022 වර්ෂය<br>රු. | විචලනය<br>රු. | විචලනය<br>ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| **ආදායම්** | | | | |
| භාණ්ඩාගාර පුනරාවර්තන ලැබීම් | 69,394,000 | 64,000,000 | 5,394,000 | 8.4 |
| භාණ්ඩාගාර ප්‍රාග්ධන ලැබීම් | 18,600,000 | 16,000,000 | 2,600,000 | 16.25 |
| උත්පාදිත පුහුණු ආදායම | 67,439,737 | 38,328,586 | 29,111,151 | 76 |
| නේවාසික පහසුකම් කුලියට දීම් | 31,534,472 | 22,556,426 | 8,978,046 | 39.8 |
| පොලී ආදායම් | 4,920,085 | 14,823,936 | 9,903,851 | 66.8 |
| **වියදම්** | | | | |
| වැටුප් වේතන සහ සේවක ප්‍රතිලාභ | 52,410,266 | 46,492,922 | 5,917,344 | 12.7 |

| | | | | |
|---|---|---|---|---|
| සැපයුම් | 10,734,865 | 9,380,648 | 1,354,217 | 14 |
| පුහුණු වියදම් | 42,699,706 | 22,239,746 | 20,459,960 | 92 |
| වෙනත් වියදම් | 2,176,251 | 1,237,831 | 938,420 | 76 |
| අළුත් වැඩියා හා නඩත්තු | 10,380,087 | 9,881,536 | 498,551 | 5 |
| සන්නිවේදන හා උපයෝගිතා වියදම් | 19,818,051 | 13,161,446 | 6,656,605 | 50 |
| පහසුකම් කුලියට දීම් වියදම් | 15,946,300 | 11,654,851 | 4,291,449 | 37 |
| බගවන්තලාව ප්‍රාදේශීය මධ්‍යස්ථාන වියදම් | 909,762 | 398,901 | 510,861 | 128 |
| ක්ෂය | 38,495,519 | 35,273,201 | 3,222,318 | 9 |

**2.3 අනුපාත විශ්ලේෂණය**

සමාලෝචිත වර්ෂයේ ජංගම හා ක්ෂණික වත්කම් අනුපාතයන් පිළිවෙලින් 1.46 : 1 ක් හා 1.07 : 1 ක් වූ අතර පසුගිය වර්ෂයේදී එම අනුපාතයන් පිළිවෙලින් 3.72 : 1 ක් හා 3.23 : 1 ක් වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ)ආයතනයේ පුස්තකාල කළමනාකරණය ස්වයංක්‍රියකරණය සඳහා රු.248,000 ක් වැය කර 2020 වර්ෂයේදී මෘදුකාංග පද්ධතියක් (KOHA) ස්ථාපිත කර තිබූ නමුත් මෘදුකාංග පද්ධතිය සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය දෘඩාංග නොමැතිවීම හා විදුලිය කප්පාදු අවස්ථාවේ දී මෘදුකාංග පද්ධතිය ක්‍රියාත්මක කිරීමට නොහැකි වීම ආදී කරුණු මත 2020 ජුනි 19 දින සිට විගණිත දිනය වූ 2024 මැයි 27 වන විට මෘදුකාංග පද්ධතිය අක්‍රිය වී තිබුණි. | මෘදුකාංගයේ පුස්තකාලය තුළ කාර්යයන් වශයෙන් මාර්ගගත සූචිය, මාර්ගගත ප්‍රතිග්‍රහණය, මාර්ගගත ග්‍රන්ථ සංස්කරණය, මාර්ගගත වාර සඟරා සංස්කරණය හා පුස්තකාලයේ මූලික පාලන කටයුතු පුස්තකාල තොරතුරු විද්‍යානුකූලව හා ප්‍රමිතයෙන් යුතුව සිදුකිරීමයි. එහෙත් එම මෘදුකාංගයේ සම්පූර්ණ ක්‍රියාවලිය සාර්ථක කර ගැනීම සඳහා තාක්ෂණික බාධාවන් කිහිපයක් විය. එනම් විදුලිය විසන්ධි වන අවස්ථාවලදී මෘදුකාංග පද්ධතිය ක්‍රියාත්මක කළ නොහැකි වීම, මෙම පද්ධතියේ වගකීම් කාලය ඉක්මවා තිබීම ආර්ථික අර්බුදය හමුවේ අප ආයතනයට මහා භාණ්ඩාගාරය විසින් ලබාදෙන මුදල් ප්‍රමාණය සීමිත වීම නිසා මෘදුකාංග පද්ධතිය සංවර්ධනය කිරීමට යොදාගන්නා තාක්ෂණික උපකරණ මිලට ගැනීමට අපහසු වීම. ආයතනය තුළ තොරතුරු තාක්ෂණය සඳහා සේවය ලබාගැනීමට ස්ථිර නිලධාරියෙක් නොමැති වීමද මෙයට ප්‍රධාන හේතුවක් වී ඇත. | පුස්තකාල කළමනාකරණ තොරතුරු පද්ධතියට අවශ්‍ය අනෙකුත් දෘඩාංග මිලදීගෙන හා අවශ්‍ය මානව සම්පත් යොදාගෙන අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ)ආයතනයේ පුස්තකාලයේ සිදුකළ ස්ථානීය පරීක්ෂාවේදී විකිණීම සඳහා 2002 හා 2003 වර්ෂවලදී මුද්‍රණය කළ රු.828,550 ක් වටිනා අත්පොත් 5,875 කින් 2023 වර්ෂය තුළ දී | පොත් අතරින් වැඩිම ඉල්ලුමක් ඇති පොත් 3 ක් හඳුනා ගත හැකි විය. ඒවා නම්, තේ නිෂ්පාදනයේදී තාක්ෂණික ක්‍රියාවලිය, තේ කර්මාන්තශාලා | අවශ්‍යතාවය නිසි ලෙස හඳුනාගෙන පොත් මුද්‍රණය කිරීමට හා මුද්‍රිත පොත් තොගය ආරක්ෂා |

| | | |
|---|---|---|
| පොත් 64 ක් පමණක් විකුණා තිබුණු අතර 2023 දෙසැම්බර් 31 දින වන විට වසර 20 කට වැඩි රු.810,325 ක අත්පොත් 5,811 ක් පුස්තකාලයේ ගබඩා කර තිබුණි. | නිලධාරින්ගේ කුසලතා වැඩමුළුව, Engineering aspect of tea processing එම පොත් 3 ට පමණක් වැඩි ඉල්ලුමක් පවතින අතර, අනෙක් පොත් සඳහා පවතින ඉල්ලුම සීමිත බව දන්වා සිටිමි. එසේ වුවද වැවිලි මානව සම්පත් සංවර්ධනයට අදාළව අත්‍යාවශ්‍ය පොත් සිසුන්ගේ අවශ්‍යතාවයට මිලදී ගැනීමට ඇති හැකියාව පුස්තකාලය සතුව ඇත. | කිරීමටද කටයුතු කළ යුතුය. |
| (ඇ)ආයතනය විසින් පුහුණු වැඩසටහන් පැවැත්වීම සඳහා ගිවිසුමකින් තොරව කුලියට ලබාගත් නිවාස 2 ක් සඳහා පෙරදාතම් සහිත ලිපි මඟින් අධ්‍යක්ෂකවරයා විසින් වරින්වර මාසික කුලිය වැඩිකිරීමට එකඟ වී 2023 වර්ෂයේදී රු.2,116,000 ක් ගෙවීම් කර තිබුණි. එසේම අත්සන් නොකළ බදු ගිවිසුම් මඟින් නිවාස 4 ක් සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.640,000 ක බදු කුලීද ආයතනය විසින් ගෙවීම් කර තිබුණි. | ආයතනයේ පාලක මණ්ඩලයේ අනුමැතිය මත ආසන්නයේ ඇති එකවර පුහුණු ලාභීන් 80 දෙනෙකුට පමණ (40×2) නවාතැන් පහසුකම් සැපයිය හැකි නිවාස දෙකක් කුලී පදනම මත ලබා ගැනීමට ආයතනය කටයුතු කොට ඇත. විධිමත් බදු ගිවිසුම අත්සන් කොට විගණන අංශය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ඇත. | සම්පූර්ණ කුලී කාලය සඳහා විධිමත්ව ගිවිසුම් ගතවී ගෙවීම් කළ යුතු අතර සියළුම සංශෝධනයන් ගිවිසුම් ප්‍රකාරව නිසි අනුමැතීන් මත සිදු කළ යුතුය. |
| (ඈ)ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩල තීරණය මත කාර්ය මණ්ඩල සාමාජිකයන් විශ්‍රාම යන විට ලබාදීම සඳහා කැරට් 22 රන් පවුම් 13.5 g ක රන් කාසි 10 ක් 2019 මැයි 30 දින පෞද්ගලික ආයතනයකින් රු.851,800 කට මිලදීගෙන එම වර්ෂයේදීම වියදම් ලෙස ලියාහැර තිබුණි. ආයතනික හා මූල්‍ය හේතු මත මෙම රන්කාසි බෙදා නොහැර වසර 3ක කාලයක් ආයතනයේ සේප්පුවේ රඳවා තිබුණු අතර 2022 වර්ෂයේ වත්කම් ලෙස ගිණුම් ගත කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසානයේදී ද රන් පැහැති කාසි 10 ක් තිබුණු නමුත් එම රන් පැහැති කාසි කැරට් 22 රත්‍රංද යන්න තහවුරු කරනොගෙන වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවලට ගැලපීමට කටයුතු කර නොතිබුණි. | රත්තරං සඳහා වැය වූ මුදල රු 851,800. වියදමක් ලෙස ලියා හැරීම 2023වර්ෂයේ ගිණුම් ප්‍රකාශවල නිවැරදි කර ඇත .මෙම රත්තරං වල වටිනාකම සහ සංයුතිය පරීක්ෂා කිරීම සඳහා මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය මඟින් ලබාගැනීමට කිරීමට කටයුතු කරනු ඇත. | ආයතනයේ අරමුණු වලට අදාළ වියදම් පමණක් දැරිය යුතු අතර මෙම රන්කාසිවල නිවැරදි වටිනාකම තක්සේරු ගිණුම් ගත කළ යුතුය. එසේම මෙම තොගය නිසි අනුමැතිය මත අපහරණය කිරීමට කටයුතු කළ යුතුය. |

## 4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ)2023 වර්ෂය තුළ ජාතික වැවිලි කළමනාකරණ ආයතනය විසින් ශක්‍යතා සංවර්ධන වැඩසටහන් 100 ක් පැවැත්වීම සඳහා රු.මිලියන 5 ක ප්‍රතිපාදනයන් කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසානයට රු.1,359,236 ක වියදමක් දරා වැඩසටහන් 52 | ආයතන විසින් කුඩා වතු හිමියන් සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන් 100 සැලසුම්කර ඒ සඳහා රු.මි.5.00 ක මුදලක් වෙන්කර පැවතුණි. එසේ නමුත් 2023 වර්ෂය තුළ ආයතනයට සිදු කිරීමට හැකියාව ලැබුණේ වැඩසටහන් 52 ක් | ආයතනයේ අරමුණු ඉටුකර ගැනීමට නිසි අධ්‍යනයකින් පසුව සැලසුම් සකස් කර එම සැලසුම් ඵලදායී ලෙස ක්‍රියාත්මක කළ යුතුය. |

| | | |
|---|---|---|
| ක් පමණක් පවත්වා තිබුණ අතර එම වැඩසටහන් 52 සඳහා 2,610 දෙනෙකුගේ සහභාගිත්වයක් අපේක්ෂා කළද ඒ සඳහා සත්‍ය වශයෙන් සහභාගී වී තිබුණේ ප්‍රතිලාභීන් 1,381 ක් හෙවත් අපේක්ෂා කළ ප්‍රමාණයෙන් සියයට 53 ක් පමණක් විය. එසේම වර්ෂය පුරාම මෙම වැඩසටහන් පැවැත්වීම සඳහා ක්‍රියාකාරී සැලැස්ම අනුව සැලසුම් කර තිබුණද ජනවාරි, පෙබරවාරි, ඔක්තෝබර්, නොවැම්බර් සහ දෙසැම්බර් මාසවල පමණක් වැඩසටහන් පැවැත්වීමට කටයුතු කර තිබූ නමුත් සෙසු මාස 07 ක් තුළ මෙම වැඩසටහනක් පවත්වා නොතිබුණි. | පමණි. ඒ සඳහා සහභාගි වූ වතුහිමියන් ගණන 1,371 ක් නොව 1,381 කි.<br>වැඩසටහන් 3 ක් උදේ සහ හවස පැවැත්වීමේදී මාරු වීමක් සිදු වී ඇති බැවින් 2023 ප්‍රගති වාර්තාවේ සහ වාර්ෂික වාර්තාවේ අගයන් නිවැරදි කිරීමට කටයුතු කරන්නෙමු. මෙම වැඩසටහන් පැවැත්වීම සඳහා භාණ්ඩාගාරයෙන් ප්‍රතිපාදනයන් ලබාදීම මූල්‍ය දුෂ්කරතා මත ප්‍රමාද වීම සිදු වීම නිසා සැලසුම් කල පරිදි මෙම වැඩසටහන් පැවැත්වීම අසීරු වී ඇත. | |
| (ආ)සමාලෝචිත වර්ෂය තුළ ආයතනය විසින් තේ පර්යේෂණ, වැවිලි කළමනාකරණ ඩිප්ලෝමා සඳහා වූ ජාත්‍යන්තර වැඩසටහන් 02 ක් පවත්වා රු.මිලියන 6.07 ක් ආදායමක් උපයා ගැනීමට අපේක්ෂා කළ ද ආයතනය විසින් එම පාඨමාලාවන් පවත්වා නොතිබූ බැවින් අපේක්ෂිත ආදායම අහිමි වී තිබුණු අතර තාක්ෂණ වැඩසටහන් 02 ක්, නිපුණතා සංවර්ධන වැඩසටහන් 4 ක්, උපාධි වැඩසටහන් එකක් සමඟ අධ්‍යාපන වැඩසටහන් 02 ක් පවත්වා පිළිවෙලින් රු.මිලියන 1.17 ක් රු.මිලියන 1.88 ක් හා රු.මිලියන 36.32 ක් උපයා ගැනීමට සැලසුම් කළ ද ආයතනයට එම වැඩදටහන් වලින් උපයා ගැනීමට හැකි වී කිබුණේ රු.මිලියන 0.56 ක්, රු.මිලියන 1.28 ක් හා රු.මිලියන 30.86 ක් පමණි. | ජාත්‍යන්තර වැඩසටහන් පැවැත්වීම මගින් ආයතනයේ පිළිගැනීම වැඩි කර ගත හැකි වන අතර ඉහළ ආදායමක් උපයා ගැනීමටද හැකි වන බැවින් සමාලෝචිත වර්ෂය සඳහා තේ රස බැලීම සහ වැවිලි කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලා 2 ක් සංවර්ධනය කරන ලදි. මෙම පාඨමාලා පිළිබඳව ප්‍රචාරණ කටයුතු කළද මේ සඳහා අයදුම්පත් ලැබී නොතිබුණි. සමාලෝචිත වර්ෂය සඳහා තාක්ෂණික සංවර්ධිත 2 ක් සැලසුම් කලද, තේ රස බැලීම පිළිබඳ වැඩසටහන් පමණක් ක්‍රියාත්මක කළ හැකි විය. සැලසුම් කරන ලද නිපුණතා සංවර්ධන වැඩසටහන් හතර අතුරින් වැවිලි ක්ෂේත්‍ර නිලධාරී සහ තේ කර්මාන්තශාලා නිලධාරී යන වැඩසටහන් පවත්වා ඇත. | ආයතනයේ අරමුණු ඉටුකර ගැනීමට නිසි අධ්‍යනයකින් පසුව සැලසුම් සකස් කර එම සැලසුම් ඵලදායී ලෙස ක්‍රියාත්මක කළ යුතුය. |